**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)**

*General Certificate of Education (Adv.Level) Examination, 2023(2024)*

**සිංහල I**
**Sinhala I**

**71- S -I**

**පැය තුනයි**
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
*Additional Reading Time – 10 minutes*

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න

**උපදෙස්:**

* **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට** පිළිතුරු සපයන්න

---

1. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ),** හා **(උ)** උද්ධෘත අතරින් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද **(ඌ)** හා **(එ)** ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) දෙමව්පියන් ගෙන්වා පාවා දෙවාලූ සමණන් සොරෙකු දැක ඌ කෙරෙහි ආලයෙන් ඌ ලවා සමණන් මරවා උන්ගෙනුත් නො ව, පසු ව සොරුන්ගෙනුත් නො ව, ඒ හැම තබා පලන් අභරණින් හා හන් පිළියෙනුත් නො වතුව කැළයක් යට හිඳ තමා ම වෙහෙසන්ට කැණහිල් වෙසක් මවා ගෙන ආ ශක්‍රයන් ලා ලජ්ජා නැති ව ශොක කාරණ විචාරා කථා කළ ස්ත්‍රිය මෙන් තමන්ගේ ශොක කාරණ තිබිය දී විචාරනු නිසා උන් කරා ගොසින් 'සකල ශරීරයෙහි සඳුන් කල්ක තවරා ගෙන සව් බරණ ලා සැරහී මල් පැලඳ මට්ටකුණ්ඩලී ලෙසින් අවුත් මේ වල් මැද අත හිස තබා ගෙන හඬව. මම වන්නා දරු ශොකයෙන් හඬමි.තෙපි කුමක් නිසා හඬා දැ'යි විචාළෝ ය. මට්ටකුණ්ඩලී ඒ අසා 'මාගේ රථ මැදිරියෙක් ඇත. ඒ තෙමේත් **ගනරන්මුවා** ය. ඊට නිසි වූ සක් සඟළෙක් නො ලැබෙමි. ලදොත් ජීවත්වන්නා මුත් නොලදොත් ජීවිතය හරිමි' යි කියා ශොක හරවන්නට කාරණ වූ ශොක කාරණය කී ය.

(i) ශක්‍රයන් ලා කතා කළ ස්ත්‍රියට අහිමිව තිබුණු වස්තු දෙකක් සඳහන් කරන්න.

(ii) මට්ටකුණ්ඩලීගේ ශෝකයට හේතු වූ කාරණය කුමක් ද?

(iii) "සකල ශරීරයෙහි සඳුන් කල්ක තවරා ගෙන සව් බරණ ලා සැරහී මල් පැලඳ ......"
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **"ගනරන්මුවා"** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ආ) ඒ රජ්ජුරුවන්ගේ මැණියන්ගේ පූර්ව ජන්මයෙහි වල්ලභයා බිසොවුන් කෙරේ සිත් තබා මිය අහේතුක ප්‍රතිසන්ධියෙහි නුහුසු ව ඉපැද එම රජගෙයි බිසොවුන්ගේ ශ්‍රී යානය යට වාසය කෙරෙයි, එක් දවසෙක බිසොවුන් උතුනී ව නහා මල් සුවඳ පැලඳ යානේ වැදහොත් කල්හි නුහුසු බිසොවුන් කෙරෙහි ප්‍රේම ධරාගත නො හෙනුයේ "රජහට පළමු මම මැ හා ආස්වාදයක් කෙරෙමි" යි යානට

නැඟී බිසොවුන් නාභියෙහි පරාමර්ශනය කෙළේ ය. ඒ වේලෙහි නාභිපරාමර්ශනය හා සමග ම බිසොවුන්ට ද රතිවලන ය විය. මවගේ උතුනීභාවයත් හා එක්තරා එක් ආකාරයෙකින් කාමයන්ගේ චලනය වීමත් හා සත්ත්වයක්හුගේ ඉපදීමත් හා මේ තුන් දෙනාගේ සමාගමයෙන් ම දරු ගබක් හටගන්නා හෙයින්, ඒ වෙලෙහි රජ්ජුරුවෝ ද ගෝනුස්සාට දා ව පිළිසිඳ ගත්හ. මේ කාරණයෙන් ඒ රජ්ජුරුවෝ ද විච්ඡිකයන්ගේ වර්ණ ඇතියහ. විච්ඡිකයන් සේ ම නිර්ගුණිය හ. ඉතා චණ්ඩය හ. එසේ හෙයින් චණ්ඩප්‍රද්‍යෝත යයි නම් ලදහ.

(i) රජ්ජුරුවන්ගේ මෑණියන්ගේ පූර්ව ජන්මයෙහි වල්ලභයා නුහුසු ව ඉපදීමට හේතුව කුමක් ද?

(ii) රජතුමා 'චණ්ඩප්‍රද්‍යෝත' යන නම ලද්දේ ඇයි?

(iii) "නහා මල් සුවඳ පැලඳ යානේ වැදහොත් කල්හි නුහුසු බිසොවුන් කෙරෙහි ප්‍රේම ධරාගත නොහෙනුයේ.........." මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) "සමාගමයෙන්" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඉ) චුල්ල ධනුර්ධර කුමාරයෝ අමු මාංශ දැක කියන්නාහු "පිලිස්සූ මාංශ නො දී අමු මාංශ දුන්නේ අප කෙරේ කනස්සලුවෙන්දැ"යි කියා දෙවැනිව බිරින්දෑ අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝප වන. ඉන් එකෙක් ''අප පන්සීයය වෙහෙස්සිය යි දැ'' යි කියා කෝපයෙන් දිවුවා වූ චුල්ල ධනුර්ධරයෝ එකින් එකාට සොරු පන්සීයය එකක් අඩු ඊ දඬු පන්සීයෙන් විද එළූහ. සොරුන් නායක තැනැත්තේ ඉවත්ව සිට අවුත් චුල්ල ධනුර්ධරයන් අල්වා ගත. සොර දෙටුවා හා චුල්ල ධනුර්ධරයන් හා උනුන් කා සොරා යට කොට ඔබා ගෙන චුල්ල ධනුර්ධරයෝ ''සොඳුර, කඩුව දී ල ව''යි අත දික් කොට ලන්නා සොරාට කඩු මිට දී චුල්ල ධනුර්ධරයන්ට කොපුව දී ලූහ. සොරා චුල්ල ධනුර්ධරයන් ඉස කපා මරා යන්නට නික්මුණු කලට ගඟක් සමීපයට පැමිණියාහ. සොර දෙටුවා සිතන්නේ ''බාල කල පටන් පරණ පුරුදු පුරුෂයා මරවා මා කෙරේ ලෝභ කළා ය. ඉදිරියේ අනෙක් පුරුෂයෙකු දුටත් මටත් මේ කරන මානය යි සිතා, මැගෙන් මට ප්‍රයෝජන නැතැ''යි මෑ මෙතන ම **ඇරපියා** යෙමි.

(i) සොරුන් කෝප වීමට හේතු වූ කාරණය කුමක් ද?

(ii) චුල්ල ධනුද්ධරයන් සොර නායකයා යටත් කර ගත් ආකාරය දක්වන්න.

(iii) "එකින් එකාට සොරු පන්සීයය එකක් අඩු ඊ දඬු පන්සීයෙන් විද එළූහ'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''**ඇරපියා**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි.)

(ඊ) ඒ ස්වර්ණතිලකා තොමෝ සස්වාමිකදෝ හෝ නොහොත් අස්වාමිකදෝ හෝයි විචාරා නියම දැන වහා කැඳවාගෙන එවයි කී ය. එබස් අසා ඔහු ගොස් එපරිද්දෙන් ම විචාරා අස්වාමික බව දැන ස්වර්ණතිලකාව කැඳවාගෙන අවුත් උද්දාල බ්‍රාහ්මණයාට පාවා දුන්හ. ඉක්බිති ඒ බ්‍රාහ්මණයා ස්වර්ණතිලකාව ගෙට ආ දවස් පටන් සාර මසක් මුළුල්ලෙහි රාජ සේවයටත් නො ගියේ ය. එ බමුණු සමීපයෙහි පන්සියයක් රජ කුමරුවෝ අක්ෂර ලිඛිත ගණිතාදී වූ නොයෙක් ශිල්ප ශාස්ත්‍ර උගනිති. එකල්හි ඒ රජකුමරුවෝ තමන් ශිල්ප උගන්ට නැති හෙයින් බමුණා ගෙන්

පිටත් නොවන කාරණය දැන ඉදින් ස්වර්ණතිලකාව ජීවත්ව වුණහොත් අපගේ ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට අන්තරාය වෙයි. එබැවින් යම්කිසි උපායකින් ඈ මරාපුව මැනැවැයි සිතා ඇතරුවන් කැඳවා ඔවුන්ට අත්ලස් දී කියන්නාහු ''එම්බා සබඳිනි, මොළ ඇතකු රා පොවා මත් කරවා ඔහු ලවා ස්වර්ණතිලකාව මරවාපියව '' යි කීහ.

(i) උද්දාල බමුණා රාජ සේවය පැහැර හැරියේ ඇයි ?

(ii) එකල සිංහලෙහි කුමාරවරුන් විසින් හදාරන ලද ශිල්ප ශාස්ත්‍ර කවරේ ද?

(iii) ''ඇය මරාපුව මැනැවැයි සිතා ඇතරුවන් කැඳවා ඔවුන්ට අත්ලස් දී කියන්නාහු...'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) සස්වාමික යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

(උ)

සව් සත කුලුණැසින්
සව් සත තියුණු නැණැසින්
නිති දක්නා විසින්
එරජමය යුතු වූයේ යුගැසින්

ඔහු තෙද දිවසකර
දිලිහෙත විකුම් ගිරි සිර
පෙර සිටි රඟ නොහැර
සිටි ද පර රද යස තුසරකර

(i) රජුගේ යුගැස් ලෙස කවියා දක්වන්නේ මොනවා ද?

(ii) දෙවන කවියේ සඳහන් වන රූපකාලංකාරවත් යෙදුම් දෙකක් උපුටා දක්වන්න.

(iii) "දිලිහෙත විකුම් ගිරි සිර" මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) ''**පර රද**'' යන්නට කෙටි විවරණ සපයන්න (ලකුණු 04 යි.)

- (ඌ) සහ (එ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න

(i) ''ඒ දෙපක්ෂයෙන් නුවණ නැත්තවුන් තෝරලා තවත් සිතට නොනැංගොත් හඬව."

(ii) "නුඹ වහන්සේගෙන් කරුණා සම්පත් දෙවා වදාළ මැනව."

(iii) "පළමුත් මූ තුමූ තොපට අනර්ථව සිටියේ වේ ද."

(iv) "යම්කිසි කෙනෙකුගේ මුහුණ ඒක් ඇසකින් හොබින්නේ නොවෙයි. "

(v) "එතන ඉන්නේ කලිසම් ඇඳපු අඩි ගහන මහත්තයෙක්."

(vi) "නිමවා ඔබ සතු කටයුතු පෙරළා එනු මැන නොලසා"

(vii) "ඇහේ රොඩ්ඩක් වැටුණම අයින් කරන එක පිංකමක්." (ලකුණු 03 x 04 =12 යි.)

(එ) පද්‍ය නිර්මාණයක සාර්ථකත්වය උදෙසා කාව්‍ය අන්තර්ගතය හා භාෂා භාවිතය ඉවහල් වන ආකාරය අවධානයට ගෙන පහත දැක්වෙන කාව්‍ය නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**ලක් මවුනි මගේ**

සි ත කි න් සිතනු බැරි තරමට තිබෙන අගේ
සැ ප ති න් වැඩෙන පෙම්බර ලක් මවුනි මගේ
ල බ මි න් පිහිට ඉටු දෙවියන්ගෙනුත් සගේ
ය හ ති න් ඉන්න මල් බර සල් රුකක් වගේ

ස තු වී තිබෙන කොට ඔබගේ සෙනේ දම
මු තු මිණි රනින් මට අත් වන පලේ කිම
පු තු වෙමි ඔබට උපදින හැම තැනේදිම
පැ තු මෙන් මගේ සිරි ලක් මව වදිමි මම

න හ මක් බලා කිසි විට හොඳ නොහොඳ පැති
ද හ අත ගලන ඔබගේ මහ කුලුණු ගති
ම හ තයි දිගයි ගම්භීරයි කියනු යුති
ම හ වැලි කැලණි කළු ගං ගල-ගලා යති

නි ව නේ මිහිර රැඳි බුදු දම් අමා කිරි
පො ව මින් නළව-නළවා ගන්වමින් දිරි
ලො ව ඔද වඩන නොකැළැල් පෙම් ගුණෙන් පිරි
ක ව රෙක් ඇද්ද මගෙ සිරි ලක් මවට සරි

ක ඳු වන රසට කැඳවා ලොව දසනුදෙස
ඉ ඳු වා වඩා සමනොළ මල් යහන් කුස
උ දු රා සමය කුල නිල බේ නපුරු විස
පු දු මයි ඔබ කවන සැටි සමහියේ රස

තෙ ව රක් තිලෝගුරු මුනි රජු වැඩම කොට
ල ව මින් අරන් පන්නා යක් සෙනඟ වට
සු ව දී වදාළේ නම් දුක් බැහැර කොට
නි ව නින් මෙපිට ඔබ වෙහි රැකවරණ මට

ද ම් සෝ නිරිඳු පුත් අරහත් මිහිඳු හිමි
ද ම් මී පෙවිය සිරිමත් ඔබ ගුණට නැමී
ම ම් ඔබෙ මුවට මුව තබමින් උරමි එ-මී
අ ම් මෙනි එය ම මුළු ලෝකෙට පොවමි එමී

(ලකුණු 12 යි.)

2. “මනුෂ්‍යත්වය පිළිබඳ සානුකම්පිත දෘෂ්ටියක් ප්‍රකට කරන ධර්මසේන හිමියෝ එයට උපහාස රසය ද මුසු කරති.” නිර්දිෂ්ට කතා ආශ්‍රයෙන් විමසන්න.

**නැතහොත්**

මිනිස් සිතෙහි සංකීර්ණතා නිරූපණයෙහි ලා ජාතක කථාකරුවා දක්වන කුසලතාව නිර්දිෂ්ට ජාතක කතා ඇසුරෙන් අගය කරන්න.

(ලකුණු 15 යි.)

3. "මනුෂ්‍ය චර්යාවන්හි කාමාශක්ත ස්වභාවය" නිරූපණය කොට එහි ප්‍රතිවිපාක පෙන්වා දීමට සද්ධර්මාලංකාර කතු හිමියන් යොදා ගෙන ඇති උපක්‍රම නියමිත කතා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න.

**නැතහොත්**

ජීවන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැප වන චරිත, පූජාවලියෙන් අපට හමු වේ. නිර්දිෂ්ට කතා ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 15 යි.)

4. (අ) සිංහල සාහිත්‍යයේ සුවිශේෂ අවධියක් ලෙස කෝට්ටේ සාහිත්‍ය අවධිය හැඳින්වෙන්නේ කවර හෙයින් දැයි උදාහරණ සහිතව පරීක්ෂා කරන්න.

(ලකුණු 07යි)

(ආ) අවස්ථෝචිත විරිත් භාවිතයෙහි වෑත්තෑවේ හිමියන් දක්වන කුසලතාව ගුත්තිල කාව්‍යය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08යි)

5. බැද්දේගම නවකතාවෙහි සාර්ථකත්වය සඳහා භාෂාව උපයෝගි වී ඇත්තේ කවරාකාරයෙන් දැයි නිදසුන් ඇසුරෙන් විමර්ශනයට ලක් කරන්න.

(ලකුණු 15යි)

6. “නූතන කෙටි කතාකරුවන් ස්වකීය නිර්මාණ සඳහා ළමා ලෝකයේ නිර්ව්‍යාජ සිතුවිලි වස්තු විෂය කොට ගෙන ඇත.” නියමිත කෙටිකතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

7. මා පිය දූ දරු සබඳතාවෙහි විවිධ පැතිකඩ කාව්‍යාත්මක ව විවරණය කිරීමෙහි ලා කවීන් දැක්වූ අවධානය කවරාකාර දැයි නියමිත පද්‍ය පන්ති ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

8. “ස්ත්‍රී පුරුෂ ප්‍රේමය යනු සියුම් හා ගැඹුරු මානව ධර්මතාවකි.” පෙමතො ජායතී සොකො නාට්‍යය ඇසුරෙන් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
*General Certificate of Education (Adv.Level) Examination, (2023)*

**සිංහල II**
**Sinhala II**

**71- S -II**

**පැය තුනයි**
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
*Additional Reading Time – 10 minutes*

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න**

**උපදෙස්:**
**I** කොටසේ ප්‍රශ්නය ද, **II** කොටසේ **2,3** ප්‍රශ්න ද, ඇතුළු ය ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න
**1** ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මේ **ප්‍රශ්න පත්‍රයේ** ම පිළිතුරු සපයන්න.
**I** කොටස, **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර** දෙන්න.

---

**I කොටස**

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 'සෘජු' යන වචනයෙහි අන්තර්ගත අක්ෂරවල උත්පත්ති ස්ථාන වනුයේ,

(1) අඝෝෂ මූර්ධජ හා ඝෝෂ තාලුජ
(2) ඝෝෂ තාලුජ හා ඝෝෂ මූර්ධජ
(3) ඝෝෂ මූර්ධජ හා ඝෝෂ තාලුජ
(4) ඝෝෂ දන්තජ හා ඝෝෂ ඕෂ්ඨජ
(5) අඝෝෂ කණ්ඨජ හා ඝෝෂ අල්පප්‍රාණ (.........)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න

(1) සාමාර්ථය , කාර්යයාලීය , කෝෂ්ටාගාරය, ඌණපූරණ, ප්‍රභාෂ්වර
(2) සමාර්ථය, කාර්යාලයීය, කෝෂ්ඨාගාරය, ඌන පූරණ , ප්‍රභාෂ්වර
(3) සාමාර්තය, කායීාලයීය, කෝශ්ටාගාරය, ඌනපූරණ, ප්‍රභාශ්වර
(4) සාමර්ථ්‍යය, කාර්යාලයීය, කෝෂ්ඨාගාරය , ඌනපූරණ , ප්‍රභාස්වර
(5) සාමර්ථ්‍යය, කාර්යාලය, කෝස්ටාගාරය, ඌණපූරන, ප්‍රභාෂ්වර (.........)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) සද්ධර්මරත්නාකරය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සද්ධර්මෝපායනය
(2) සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාකරය, සද්ධර්මෝපායනය
(3) සද්ධර්මෝපායනය, සද්ධර්මරත්නාකරය, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය
(4) සද්ධර්මාලංකාරය, සද්ධර්මෝපායනය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මරත්නාකරය
(5) සද්ධර්මෝපායනය, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාකරය

(……)

1.4 පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) සම්භාව්‍ය ගද්‍ය ව්‍යවහාරයේ 'ඓ' ස්වරය 'අයි' යනුවෙන් ද ලියා දැක්වේ.

(2) 'ඓ' යනු සංයුක්ත ස්වරයකි.

(3) ශුද්ධ සිංහල හෝඩියෙහි ඓ ස්වරය ඇතුළත් වේ.

(4) අ+ඉ ස්වර සංයෝගයෙන් ඓ ස්වරය සෑදී ඇත.

(5) වෛයිකල්පික යන වචන නිවැරදි ය . (........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න

(1) සොබාදම් මාතාව, නගර වර්ණනා, ජාතික ධජය, වියෝ ගීත

(2) බැති පූජා, වෛද්‍ය පීඨය, මාර්ග සලකුණු, තුරුලතා

(3) ජංගම දූරකථන, කොරියානු භාෂාව, සක්මන් මළුව, ශිල්ප ශාස්ත්‍ර

(4) ධර්ම සාකච්ඡා, සරසවි ප්‍රවේශය, ස්ථාවර ගිණුම්, කාර්ය පත්‍රිකා

(5) දරු ස්නේහය, ඝන අඳුර, උත්තර දිශාව, සොඳුරු දිවිය (........)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද ?

(1) ශූර , භාර, ක්‍රූර, මාර

(2) භුවන, ශ්‍රවණ, භ්‍රමණ, නුවණ

(3) නිද්‍රා, ශ්‍රද්ධා, බාධා, නින්දා

(4) ප්‍රාප්ති, බිත්ති, ශක්ති, භක්ති

(5) රාව, දේව, දුව, භාව (…….)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න

(1) විමන, සවන, වාහන, වුවන

(2) මේද, වාද , පුද, සඳ

(3) අරුණ , වරුණ, තරුණ, පොරණ

(4) ඉවුර , පවුර , උදර , මැඳුර

(5) හෙළ , හල ,විල , දූල (…….)

1.8 **පුරවැසි, බරනෙත්, වතුපිටි, සඳවත** යන වචන අයත් සමාස වර්ග අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) දකාරාර්ථ, අව්‍යය, විශේෂණ, අන්‍යාර්ථ

(2) විශේෂණ, අන්‍යාර්ථ, විභක්ති, දකාරාර්ථ

(3) විභක්ති, අව්‍යය, දකාරාර්ථ, අන්‍යාර්ථ

(4) විභක්ති, අන්‍යාර්ථ, දකාරාර්ථ, විශේෂණ

(5) දකාරාර්ථ, විශේෂණ, විභක්ති, අව්‍යය (......)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පිසින, වචන, තෝරන, පුරන

(2) නෙළුම්, ඇඳුම්, ගැටුම්, පැසසුම්

(3) මෘත, කෘත, වින්දිත, ප්‍රකාශිත

(4) දර්ශන, භෝජන, වර්ධන, මර්දන

(5) උගත්, හොත්, රැගත්, ජගත් (......)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) **ඇසුව** ඔහු වෙණ නද

(ආ) **වඳිනුව** පා පියුම් පෙති

(ඉ) **කියව** තොප නම් ගොත් කුමක් ද?

(ඊ) **සරා** අවන්හල් සහසේ

(1) විධි ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශීර්වාද ක්‍රියා

(2) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා

(3) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා

(4) අපර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(5) අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අපර ක්‍රියා (......)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) එඩිතර, පාපතර, ගරුතර, මධුරතර

(2) වරලස්, මුහුලස්, සිසිලස්, සෙනෙහස්

(3) කාලීන, නවීන, ප්‍රවීණ, කුලීන

(4) කුසලතා, දක්ෂතා, එකඟතා, සබඳතා

(5) ලබ්ධික, දෘෂ්ටික, ජාතික, සංස්කෘතික (......)

1.12 උපසර්ගයක් යෙදී නොමැති වචනයක් සහිත වරණය තෝරන්න.

(1) පරිහානි, පරිමිත, පරිශුද්ධ, පරිවාස

(2) ආවාස, ආගම, ආයාචන, ආනයන

(3) ප්‍රකෘති, ප්‍රගති, ප්‍රයෝග, ප්‍රමාණ

(4) දුලද, දුමිඳු, දුදන, දුලබ

(5) අනුමාන, අනුරූප, අනුවර්තන, අනුභව (......)

1.13 . නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න

(1) පිණිස, අනුව, නිසා, තුරු

(2) නමුත්, වහා, දක්වා, විනා

(3) අයුරු, යළි, පවා, හැර

(4) පාසා, සෙද, නමුත්, ලෙස

(5) වනාහි, බැවින්, මඳ, නම් (......)

1.14. අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී නිසි අවධානය යොමු කළ යුත්තේ, කුසලතා සපිරි පිරිසක් රටට දායාද කිරීමේ ඉෂ්ටාර්ථය උදෙසා ය.

යන වාක්‍යයෙහි වදන් යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) උපසර්ග, සන්ධි, තද්ධිත

(2) තද්ධිත, උපසර්ග, සන්ධි

(3) සන්ධි, උපසර්ග, තද්ධිත

(4) තද්ධිත, සන්ධි, උපසර්ග

(5) උපසර්ග, තද්ධිත, සන්ධි (......)

1. 15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) කියමින්, ගයමින්, බිබී, පනිමින්

(2) සෙව්වේ ය, බැලුවේ ය, මැව්වෝ ය, රැක්කෝ ය

(3) නටවයි, නංවයි, කරවයි, බලවයි

(4) බලව, එනු, වැටෙවු, රකිත

(5) දිව්වේ ය, නැමුවේ ය, පැන්නේ ය, එන්නේය (......)

1. 16. සමාසයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) තුනපහ, ඉරහඳ, පිංපඩි, නොමිනිස්

(2) අකුසල්, අත්කම්, ගුරුපඩුරු, සරාසඳ

(3) තිසරණ, මිණිමුතු, කිරිබත්, රත්මල්

(4) දසබල, පොල්තෙල්, රජපිරිස්, ගත්කරු

(5) සොරබිය, අනුබල, දර්ශන, ගීනැටුම් (......)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) සුරඟන, දිගැසි, අනුරුත්, පසැස්

(2) සුරිඳු, අරුණලු, ගුණැති, රියැදුරු

(3) මුදලිඳු, ගුරුතුමා, ඔබිනොබ, නිලුපුල්

(4) උපනුපන්, දෑත, නිලඹර, බුත්සරණ

(5) සිතුවම්, අල්ලස්, දුප්පත්, ගෙත්තම් (......)

1. 18. ව්‍යාකරණානුකූල ව නොගැළපෙන වරණය කුමක් ද?

(1) අධිෂ්ඨාන, අවධාරණ, සුවිශේෂ, සන්තාප

(2) දුබලතා, සෞන්දර්ය, ආධිපත්‍ය, නිහැඬියා

(3) දයානුකම්පා, ජාත්‍යාලය, පුනරුත්ථාපන, පූජෝත්සව

(4) ලියමන, දවටන, දඩුමුවා, පැස්සුම්

(5) ඉක්බිති, හෙයින්, අරබයා, පරිදි (......)

1. 19. ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) ඡන්දදායකයෝ බුද්ධිමත් වෙත් නම් යහපත් රටක් බිහි වනු ඇත.

(2) චිත්‍රශිල්පියෙක් වන හෙතෙම ගෙවන්නේ සරල ජීවිතයකි.

(3) අනතුරෙන් තුවාල ලැබූවන් වහා රෝහල් ගත කරන ලදි.

(4) අපි හැම විට ම බුද්ධිමත් ව කටයුතු කරන්නන් විය යුතු ය.

(5) ලෝකෝපකාරය රචනා කළෝ රණස්ගල්ලේ හිමියන් ය. (......)

1. 20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) ඒ කට්ටිය ඇවිත් ඉන්නේ ප්‍රදර්ශනය නැරඹීමට ය.

(2) වර්ෂාව නතර වෙන කොට ක්‍රිකට් තරගය යළි ඇරඹිණ.

(3) හිරු රැසින් දිලෙන කඳු පන්ති ඈතට පෙනේ.

(4) බොහෝ දෙනා රැකියාව සඳහා ගමේ ඉඳල නගරයට යති.

(5) අපි කවුරුත් සතුටෙන් ජීවත් වෙනවා. (.....)

(ලකුණු 20 යි.)

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)

*General Certificate of Education (Adv.Level) Examination, (2023)*

සිංහල II
Sinhala II

**71- S -II**

## II කොටස

- මෙම කොටසින් **2,3**, ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **සතරකට** පමණක් පිළිතුරු සපයන්න

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ කර්මාන්ත වර්තමාන ආර්ථික සැලසුම් හා සංවර්ධන කටයුතුවල ප්‍රධාන තැනක් ගන්නා නමුදු සාපේක්ෂව ඒවාට ඇත්තේ අවුරුදු 45 ක පමණ කෙටි ඉතිහාසයකි. ශ්‍රී ලංකාවේ කාර්මික ව්‍යාප්තිය පිළිබඳ රජය සතු කාර්යභාරය දැක්වෙන 1941 ප්‍රථම කාර්මික ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව පෞද්ගලික ව්‍යවසායකයන් පැවති අවස්ථාවලින් ප්‍රයෝජන ගත්තේ මන්දගාමීව බැවින්, රජය පුරෝගාමියෙකු ලෙස ඉදිරිපත් වී සුදුසු කර්මාන්තවල ආයෝජන යෙදවීමෙන් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ කර්මාන්ත ව්‍යාප්තිය කෙරෙහි උත්තේජකයකු සේ ක්‍රියා කරන බව සඳහන් විය. එකල පැවති යුද්ධය නිසා කාර්මික ආයතන වල උග්‍ර හිඟය හේතු කොටගෙන මේ ප්‍රතිපත්ති ප්‍රකාශය කඩිනම් කෙරිණ. එහි ප්‍රතිඵලයක් වශයෙන් සපත්තු කර්මාන්තය හා හම් පදම් කිරීමේ කර්මාන්තය, වීදුරු, තුනී ලෑලි හා වෙනත් කුඩා කර්මාන්ත කිහිපයක් ආරම්භ කරන ලදි. එහෙත් 1945 වර්ෂයේ දී යුද්ධය අවසන් වූ විට ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැවති කර්මාන්ත බොහොමයක් සම්පූර්ණයෙන් විනාශ කරමින් ලාභ ආයාත භාණ්ඩ දිවයින තුළට ගලා ආවේය. වීදුරු කර්මාන්තය හා තුනී ලෑලි කර්මාන්තය පමණක් නොනැසී පැවතිණ. 1946 වර්ෂයේ දී කාර්මික ප්‍රතිපත්තිය සමාලෝචනය කළ රජය, මූලික සහ මූලික නොවන යනුවෙන් කර්මාන්ත වර්ග කිරීමට තීරණය කළේය කාර්මික උපාය මාර්ග වැදගත්කමකින් යුත් අධික ප්‍රාග්ධන වියදමක් අවශ්‍ය කර්මාන්ත, මූලික කර්මාන්ත ලෙස වර්ග කෙරිණ. මූලික කර්මාන්ත රජයේ අයිතිය යටතේ පැවතිය යුතු යයි ද, මූලික නොවන කර්මාන්ත පෞද්ගලික අංශය සඳහා වෙන් කර, අවශ්‍ය ඕනෑම අවස්ථාවක ඒවාට රාජ්‍ය ආධාර සැපයිය යුතු යයි ද තීරණය විය. ආරම්භයේදී රජය විසින් සිමෙන්ති, කඩදාසි සහ කොස්ටික් සෝඩා ආදී කර්මාන්ත පිහිටුවන ලදි.1955 වර්ෂයේ දී තුනී ලෑලි සහ පිඟන් භාණ්ඩ කර්මාන්ත ද රාජ්‍ය සංස්ථා බවට පත්කරන ලදි. 1956 - 1960 අතර කාලයේ දී ලුණු, ඛණිජ වැලි හා කුඩා කර්මාන්ත යන සංස්ථා තුන පිහිටුවන ලදි. 1960 – 1965 අතර වර්ෂවලදී වානේ, ඛණිජ තෙල්, ටයර් හා ලෝහ භාණ්ඩ සංස්ථා නිෂ්පාදන තත්ත්වයට පත් විණ.1970 සහ 1975 වර්ෂ අතර කාලය තුළ පොහොර, ආකර සහ ඛනිජ ඇඹුරුම් ද්‍රව්‍ය ,ඉස්කාගාර, සීනි, ධීවර සහ දැව යන සංස්ථා හතක් පිහිටුවන ලදි. 1970 සිට රජයට පවරාගත් ව්‍යාපාර කටයුතු යනුවෙන් තවත් කර්මාන්ත වර්ගයක් රාජ්‍ය අංශයට එක් කරන ලදි. ඒවා නම් බෝගල මිනිරන්, විජය උළු, නුරානි උළු, ලංකා පිඟන් මැටි, යුනයිටඩ් මෝටර්ස්, ගෑස් සමාගම, ලංකා ඔක්සිජන් හා වාණිජ සමාගම ය, වතු වැවිලි රජයට පවරා ඒවායේ පාලනය සඳහා සංස්ථා දෙකක් පිහිටුවන ලද්දේ මේ කාලයේ දීය.ඒවා නම් ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාවය. 1989 වර්ෂයේ දී සංස්ථා ජනතාකරණය ආරම්භ වූ අතර පළමුවෙන් ම ජනතාකරණය කරනු ලැබුවේ යුනයිටඩ් මෝටර්ස් ආයතනයයි.

(i) පුරෝගාමියකු ලෙස ඉදිරිපත් වී සුදුසු කර්මාන්තවල ආයෝජන යොදවන බව ප්‍රථම කාර්මික ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි සඳහන් කිරීමට රජය ක්‍රියා කළේ කවර හෙයින් ද?

(ii) 1945 වර්ෂයේ යුද්ධය අවසන් වීමෙන් පසු ඒ වන විට වර්ධනය වෙමින් පැවති කර්මාන්ත බොහොමයක් සම්පූර්ණයෙන් විනාශ වීමට බලපෑ හේතුව කුමක් ද?

(iii) සංස්ථා ජනතාකරණ ක්‍රියාවලියේ ආරම්භය සනිටුහන් කරමින් ප්‍රථමයෙන් ම ජනතාකරණය කරනු ලැබුවේ කුමන ආයතනය ද?

(iv) 1970 – 1975 වර්ෂ අතර කාලය තුළ පිහිටුවන ලද නව සංස්ථා මොනවා ද?

(v) ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ රාජ්‍ය වැවිලි සංස්ථාව පිහිටුවීමේ අරමුණු වූයේ කුමක් ද?

(vi) මූලික කර්මාන්ත සහ මූලික නොවන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා රජය ගත් තීරණය කුමක් ද?

(ලකුණු 02 x 6 = 12යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් ඒකක් පමණ** වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

නවීන යුගයේ පොත් කවරය ශීඝ්‍ර වේගයෙන් විකාශනය වන්නට පටන් ගත්තේ මුද්‍රණ ශිල්පයේ වර්ධනයත් සමගයි. චීන ජාතිකයන් විසින් ක්‍රිස්තු වර්ෂයෙන් පසු අටවන ශත වර්ෂයේ දී අමුණන ශිල්ප අකුරු භාවිතය සොයා ගත්තාට පසුව, මුද්‍රණ ශිල්පය අපරදිගට සංක්‍රමණය වූයේ ය. අපරදිග රටවල මුද්‍රණ ශිල්පයේ පියා වශයෙන් සලකනු ලබන්නේ ගුටෙන්බර්ග් නම් ජර්මන් ජාතික ශිල්පියායි. ඔහු විසින් 1400 අග හරියේ දී ''මයිනස්'' බයිබලය නම් ග්‍රන්ථය මුද්‍රණය කළේ ය. මෙය පේළි හතළිස් දෙකේ බයිබලය වශයෙන් ද නම් කෙරේ.

මුද්‍රණ ශිල්පය පිළිබඳ ඉතිහාසයෙහි බටහිර යුගයේ මුල් අවධිය නම් කෙරෙන්නේ 'තොටිල්ලේ යුගය' යන අරුත ඇති (ඉන්කියුනැබ්‍යුලා) නම් පදයෙනි. එයට අයත් වන්නේ ක්‍රිස්තු වර්ෂ 1501 ට පෙර යුරෝපයේ මුද්‍රිත පොත්පත් ය. පොත් 35,000ක් පමණ මේ තොටිල්ලේ යුගයට අයත් වේ.

ඒවායේ කවරය, ප්‍රධාන වශයෙන් ම පොතේ නම සහ ප්‍රකාශන විස්තර සහිත සරල ස්වරූපයක් ගත්තේ ය. ඒවායේ අකුරු සහ රේඛා කිසිසේත් ම විචිත්‍රත්වයක් සඳහා යොදා ගත් ඒවා නොවී ය. අද යුගයේ පොත් කවර හා සසඳන කල්හි. ඒ පැරණි 'තොටිල්ලේ යුගයේ' ග්‍රන්ථයෙහි කවරය, කර්කශ ලක්ෂණ සහිත වූවක් සේ පෙනේ.

එහෙත්, ඒ යුගයේ පවා ඇතැම් පොත් පත්වල කවරයේ ඉතා අලංකෘත ලෙස සැකසූ අකුරු මුද්‍රණය කෙරුණු අවස්ථා තිබුණේ ය. ඒ අකුරු නම් කෙරුණේ 'රූබ්‍රික්' වශයෙනි.

අකුරක් ඉතා විචිත්‍ර හැඩතල හා වර්ණ සහිත වන පරිදි ඇඳීමේ ලේඛන කලාව, යුරෝපයේ පැවැත්තේ මුද්‍රණ ශිල්පය ආරම්භ වීමටත් පෙර සමයේ පටන් ය. එවැනි විචිත්‍ර රූබ්‍රික් අක්ෂර කලාවේ ප්‍රවීණයන් වූයේ පූජකවරු පොත් කවරය අනුක්‍රමයෙන් නවීකරණය වන්නට පටන් ගත්තේ, ග්‍රන්ථ බහුල වශයෙන් මුද්‍රණය කරන්නට පටන්ගත් විටයි.

(ලකුණු 13යි.)

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) නූතන සන්නිවේදන තාක්ෂණික මෙවලම්වලට නතු වීමෙන් මතු වන ගැටලු

(ii) ආගමික සංකල්ප අර්ථකථනය හා පොදු සමාජ ආකල්පය

(iii) වර්තමාන අධිපරිභෝජනවාදී සමාජයේ සීමිත පාරිසරික සම්පත් කළමනාකරණයේ වැදගත්කම

(iv) බෝ නොවන රෝග අවම කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ජීවන රටා

(v) ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජ වටපිටාවක දරුවන්ගේ සුරක්ෂිතතාව පිළිබඳව පවත්නා අභියෝග

(ලකුණු 25යි )

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) එදිරිවීර සරච්චන්ද්‍ර නවකතා රචකයෙක් මෙන් ම නාට්‍ය නිෂ්පාදකවරයෙක් ද විය.

(ii) වැද්දන් විසින් සතුන් දඩයම් කෙරෙති.

(iii) තම දරුවන් අවුරුද්දට ගමට එති 'යි දෙමවුපියෝ පෙර මග බලා සිටිති.

(iv) ඇතැමෙක් ගී ගයද්දී පිරිස රංගනයේ නිරත වූහ.

(v) බොහෝ මිනිස්සු ආත්මාර්ථකාමී වන්නේ ඇයි?

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) මැණියෝ තම දරුවන් නොමගට යා නොදී රකිති.

(ii) කර්මාන්තශාලා හිමියෝ සේවකයන්ට දිරි දීමනා ලබා දුන්නෝ ය.

(iii) අමාත්‍යාංශ ප්‍රධානීහු ස්වකීය ආයතනවල කටයුතු අධීක්ෂණය කළහ.

(iv) ඇමතිතුමා මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාව විධිමත් කිරීමට කටයුතු යෙදී ය.

(v) සොබාදහම ප්‍රිය කරන්නෝ වෘක්ෂලතාවන් සුරක්ෂිත කරති.

(ඉ) ව්‍යාකරණානුකූල වාක්‍යයක් නිර්මාණය කිරීමට යෝග්‍ය පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) බොහෝ (විද්වතුන්/විද්වත්හු) මාධ්‍ය සදාචාරය ගැන කතා කළ ද (මාධ්‍යවේදීන්/මාධ්‍යවේදීහු) බහුතරයක් ඒ පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කර නැත.

(ii) අත්‍යවශ්‍ය භාණ්ඩ මිල පාලනයට යටත් කිරීමට (පාලකයන්/පාලකයෝ) කටයුතු නොකරන බැවින් (පාරිභෝගිකයෝ/පාරිභෝගිකයන්) තවදුරටත් පීඩාවට පත් වෙති.

(iii) (නර්තනශිල්පීහු/නර්තනශිල්පීන්) නිසා වර්ණවත් වූ රාජ්‍ය නාට්‍ය උලෙළට (ආරාධිතයන්/ආරාධිතයෝ) විශාල පිරිසක් සහභාගි වූහ.

(iv) සෞඛ්‍ය සම්පන්න (මිනිසුන්/මිනිස්සු) සිටින ජාතියක් ගොඩනැගීමට නම් සෞඛ්‍ය (බලධාරීන්/බලධාරීහු) නිසි පියවර ගත යුතු ය.

(v) දැඩි ආත්ම විශ්වාසයකින් කටයුතු කළ (අයෙක්/අයෙකු) වූ ඔහු වර්තමානයේ ප්‍රකට (ව්‍යාපාරිකයකු/ව්‍යාපාරිකයෙක්) ලෙස නම් දරා ඇත.

**(ලකුණු 05× 03 =15යි.)**

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි **අනු අංගය** දක්වන්න.

(i) **වචනවලින්** නැගෙන **විවිධාර්ථ** භාෂාවෙහි පෝෂණය **සඳහා** ඉවහල් වෙයි.
(වචනවලින් - විභක්ති, විවිධාර්ථ - සන්ධි, සඳහා - නිපාත)

(ii) නගරය අබියස ඉදිකොට ඇති **දර්ශනීය** තොරණ **සඳැහිති** ජනයා තුළ සතුට **වඩවයි.**
(දර්ශනීය - ප්‍රත්‍යායාර්ථ, සැදැහැති - සන්ධි, වඩවයි - ක්‍රියා)

(ii) **කම්කරුවෝ** සුළඟින් ඉදිරී **වැටුණු** ගස කපා ඉවත් කොට මාර්ගය **ඉක්මනින්** පිරිසිදු කළහ.
(කම්කරුවෝ - සමාස, වැටුණු - කෘදන්ත, ඉක්මනින් - විශේෂණ)

(iv) පාසල් **දරුදැරියන්ගේ පෞරුෂය** සංවර්ධනය උදෙසා වැඩ පිළිවෙළක් **සැකසීම** බලධාරීන් සතු වගකීමකි. (දරුදැරියන්ගේ - සමාස, පෞරුෂය - තද්ධිත, සැකසීම - කෘදන්ත)

(v) **ගොවීහු ඉමහත්** වෙහෙසක් **දරා** ගොවිතැන් කොට රටට බත සපයති.
(ගොවීහු - විභක්ති, ඉමහත් - උපසර්ග, දරා - ක්‍රියා)

(ලකුණු 15යි)

6. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(අ)

(i) වනපෙත සරසන .................. වෘක්ෂයෝ නොමිනිසුන් අතින් වැනසෙති.
(ii) .................... නර්තනාංගයන්ගෙන් අලංකෘත ප්‍රසංගය කාගේත් අවධානයට ලක් වූයේ ය.
(iii) .................... මේඝ වලා සමූහයෝ අහස් කුස වසා ගත්හ.
(iv) සිඟිත්තෝ ................. ඇඳුමෙන් සැරසී නටන්නට වන්හ.
(v) නියඟය නිමා කොට ................ වැස්සක් පතිත විය.
(vi) හිරු පායත් ම ........................ අඳුර නැසී යයි.

(විසිතුරු, මහා, ඝන, විචිත්‍ර, මහ, ඝන) (ලකුණු 1/2 x 6 = 03 යි)

(ආ) පහත සඳහන් වාක්‍යය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

කාශ්‍යප රජ්ජුරුවෝ රජ වෙන්නත් කලින් සීගිරිය ජනාවාසයක් වෙලා තිබුණායි කියල පුරාවිද්‍යාඥයෝ කියනවා. (ලකුණු 1/2 x 6 = 03 යි)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) ජීවත්වීමේ දී සොබාදහම **මිතුරකු** සේ **අපට** උදවු කරයි.
(iii) **ගසේ** ගෙඩි ද **මලේ** පැණි ද සතුන්ගේ ප්‍රියතම ආහාර ය.
(iv) **අම්මා** දුන් අවවාදය **දුව** මුදුනින් පිළිගත්තා ය.

(ලකුණු 1/2 x 6 = 03 යි)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

දරුව ඔබට ගීතයක් ගායනා කළ හැකි ද යන ප්‍රශ්නය අසත් ම වේදිකාව වෙත පැමිණි සිසුවා මිහිරි හඬින් ගීයක් ගයද්දී ප්‍රේක්ෂකයෝ අසුන්වලින් නැගී සිටියහ අත්පොළසන් දුන්හ ස්තුති කළහ.

(ලකුණු 1/2 x 6 = 03 යි)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) 'මම ඔවුන් ඉතා හොඳින් හඳුනමි' යි මිතුරා පැවසී ය.

(ii) 'නරඹන්නනි, මර්ගයෙන් ඉවත් වී තරගකරුවන්ට ඉඩ දෙන්නැ' යි සංවිධායකයා ඉල්ලා සිටියේ ය.

(iii) 'යල කන්නයට පෙර වැව ප්‍රතිසංස්කරණය කර දෙන්නෙමු' යි නිලධාරීහු පොරොන්දු වූහ.

(ලකුණු 1 x 03 = 03 යි)

7.පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මාස ගණනාවකින් වට වැසි බිඳකින් තබා පිනි බිඳකින් වත් සිසිලක් නොලත්, හමන සුළඟින් පවා තෙතමනයක් නොලත්, ගිනිගත් යසුණු රැසක් මෙන් කකියන, මරු කතරක් වන්, වාලුකා තලයක අසකු පිටින් ගමන් යන තරුණ පුරුෂයෙක් දක්නා ලැබේ. බලවත් අවු රස්නෙන් තැව් තැවී දහදිය සල සලා පෙනෙන තෙක් මානේ මඟ දෙපස, නිතොර සෝදිසියෙන් බල බලා ගමන් කරන මේ පුරුෂයාට බැලු බැලූ අතින් පෙනෙන්නේ මනා සේ සුදු වැලි අතුළ සිත්කලු උයනෙක, තැන තැන රෝපිත මල් ගොමු සමූහයක් වන් වල් පඳුරු පමණකි; බැදි කුට්ටි පමණකි. මේ වැල් බැඳුණු අතු පතර ඇති, මහ ගසින් සැදුම් ලත්, අඳුරු වනයක් නොවේ. එසේ ද වුව, සෙසු නොයෙක් අනිත් සර්වාංගික සම්පූර්ණ මහ වනයකි. කැලය සුලභ **නොවන නිසා** නොවන නිසා නොව ජලය සුලභ නොවන හෙයින්, මෙවැනි බිම් වනැතුනට හා වනසූකරයනට ඒ තරම් ප්‍රිය මනාප නැති වත්, **දිවි - මුව - වලස්** ආදි සිවුපා ගණයටත්, **මොනර සැවුල් පරෙවි** ආදි පක්ෂි ගණයටත්. නා **පොළොං** වැනි සර්ප ගණයටත් අහිතකර නොවන හෙයින් මෙහි එබඳු සත්තු නොමඳ ව වෙසෙති.

(i) තද කළු අකුරෙන් මුද්‍රිත වචන ආකාරාදි පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

(ii) යසුණු රැසක්, සිවුපා, පුරුෂයාට යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

(iii) මිශ්‍ර ක්‍රියා පද තුනක් මේ ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න. නොයෙක්, සර්වාංග, වනැතුනට

(v) මේ ජේදයෙහි ඇතුළත් අඝෝෂ ඌෂ්මාක්ෂරයක් හා ඝෝෂ මහාප්‍රාණාක්ෂරයක් ඇතුළත් වචනයක් උපුටා දක්වන්න.

(ලකුණු 05 x 03 = 15 යි)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) සර්ව නාම පද

(ii) ඕෂ්ඨජ අක්ෂර

(iii) පරස්වරලෝප සන්ධිය

(iv) අසම්භාව්‍ය ක්‍රියා

(v) අන්‍යාර්ථ සමාසය

(ලකුණු 05 x 03 = 15 යි)

අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2023(2024)

# 71 සිංහල - 1

## ලකුණු බෙදී යාම -I පත්‍රය

**මේ ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.**

<u>පිළිතුරු පත්‍රය</u>

01. (අ)

(i) දෙමාපියන් විවාහ කර දුන් සැමියා/සොරා/පලන් අභරණ හා ඇඳුම්. (මෙයින් දෙකක් ප්‍රමාණවත් ය.)

(ii) ගනරන්මුවා රථ මැදිරියට සුදුසු රෝද දෙකක් නොමැති වීම

(iii) සියලු සිරුරෙහි සඳුන් කල්ක ආලේප කර සියලු ආභරණ ලා ගෙන අලංකාර වී මල් පැළඳ ගෙන

(iv) තනිරනින් නිම වූ

(ආ)

(i) බිසවුන් කෙරෙහි සිත් බැඳීමෙන් යුතු ව මිය යෑම

(ii) නුගුණ ඇති බව හා දරුණු බව ද වර්ණය ද ඇති බැවිනි

(iii) ස්නානය කොට මල් සුවඳ පැළඳ වැතිරුණු විට ගෝනුස්සා බිසව කෙරෙහි වූ ඇල්ම දරා ගත නොහැකි වූයේ

(iv) එකතුවෙන්,සමවායයෙන්,සංයෝගයෙන්

(ඉ)

(i) ඔවුන් යැවූ අමුමාංශ නැවත යැවීම

(ii) නායකයා සමග පොර බදා යටත් කොට ඔබාගෙන

(iii) එක් එක් සොරුන් පන්සීයය ඊතල 499න් විද දැමූහ

(iv) අත්හැර දමා යන්නෙමි

(ඊ)

(i) ස්වර්ණතිලකා ඇසුරෙහි රැඳී සිටීමට අවශ්‍ය වූ බැවින්

(ii) අක්ෂර ලිඛිත ගණිතාදිය

(iii) ඇය මරා දැමිය යුතු යැයි සිතා ඇත්ගොව්වන් කැඳවා අල්ලස් දී කියන්නෝ

(iv)ස්වාමියකු සහිත/ ස්වාමියකු සිටින බව/ විවාහක

(ලකුණු 01×4 =4 යි)

(උ)

(i) කරුණාව නැමැති ඇස සහ නුවණ නමැති ඇස

(ii) තෙද දිවසකර, විකුම් ගිරි සිර, යස තුසරකර

(iii) ඔහුගේ තේජස නමැති හිරු වික්රමය නැමැති කඳු මුදුනෙහි දිලිසෙන කල්හි.

(iv) අන්ය රජවරුන්/සතුරු රජවරුන්

(ඌ)

(i) දඹදෙණි යුගයේ දී ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. අදින්න පුබ්බක බමුණා හඬන සොහොනට පැමිණෙන මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයා බමුණා අමතා මෙසේ පවසන්නේ ඔවුනොවුන්ගේ ශෝක කාරණා අතුරින් වඩාත් නුවණැති ශෝකකාරණය කුමක්දැයි විමසන අවස්ථාවේ දී ය.

(ii) දඹදෙණිය යුගයේ දී මයුරපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ ජීවක කථා වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. බිම්සර රජුගේ භගන්දරාබාධය සුව කිරීමෙන් පසු ප්‍රසාදයට පත් රජු ඇතොර ස්ත්‍රීන්ගේ පලන් ආභරණ, ජීවකට ත්‍යාග ලෙස පිරි නමයි. ජීවක වෛද්‍යවරයා ඒවා ප්‍රතික්ෂේප කොට රජුගේ ප්‍රසාද අපේක්ෂා කරමින් රජු අමතා කරන ප්‍රකාශයයි.

(iii) කුරුණෑගල යුගයේ රචනා වී යැයි සැලකෙන පන්සිය පනස් ජාතක පොතේ චුල්ල ධනුග්ගහ ජාතකයේ වර්තමාන කතාවෙන් උපුටා ගැනුණි. ස්ත්‍රියක නිසා සසුනෙහි කලකිරී සිටි භික්ෂුව අමතා ඔහු යථා මාර්ගයට ගනු පිණිස බුදුරජාණන් වහන්සේ විසින් කරන ලද ප්‍රකාශයයි.

(iv) ගම්පොළ යුගයේ දෙවන ධර්ම කීර්ති සංඝරාජ හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාර කෘතියෙන් උපුටා ගැනුණකි. එහි එන නන්දි වාණිජ වස්තුවේ සීව නම් ඇමතියාගේ සේවිකාව නන්දිය වෙළඳුන්ගේ භාර්යාව පොලඹවා ගනු පිණිස කතා කරන අවස්ථාවේ දී ඇය අමතමින් කරන ප්‍රකාශයයි.

(v) ඒ.පී.ගුණරත්නයන් විසින් අනුවර්තිත බැද්දේගම නවකතාවේ පස්වන පරිච්ඡේදයෙන් උපුටා ගන්නා ලද්දකි. සිලිඳුගේ අසනීප තත්ත්වය ගැන කම්පා වන කර්ලිනාහාමි ඔහු සුව කර දෙන මෙන් අයැද සිටීමට පුංචිරාල වෙත යයි. ඒ අවස්ථාවේ දී කර්ලිනාහාමි අමතන පුංචිරාල රජයේ රෝහලේ වෛද්‍යවරයා ගැන මෙසේ ප්‍රකාශ කරන්නේ ය.

(vi) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචිත "පේමතෝ ජායති සෝකෝ" නාට්‍යයේ තුන්වන අංකයෙන් උපුටා ගත් ප්‍රකාශයකි. උද්දාල බමුණා හා ස්වර්ණතිලකා පෙම් පිළිසඳරේ සිටිමින් බමුණාට රාජ සේවයට යන ලෙස සමු දෙන අවස්ථාවේ දී ස්වර්ණතිලකා උද්දාල බමුණාට මෙසේ පවසන්නී ය.

(vii) නිශ්ශංක විජේමාන්නයන්ගේ "තිත්ත සීනි" කෙටි කතා සංග්‍රහයේ එන "ගස්" කෙටි කතාවෙන් උපුටා ගත් ප්‍රකාශයකි. තමාට එරෙහිව සිටින ගුණපාල රහසින් ඝාතනය කරන්නට කර්තේලිස් මුදලාලි සිරිසේන ගෙන්වා ගත් අවස්ථාවේ දී ඔහු අමතන මුදලාලිගේ ප්‍රකාශයකි.

(එ) යටත් විජිත සමයක දේශාභිමානී හැඟීම් කුළු ගන්වමින් මාතෘ භූමිය කෙරෙහි අප්‍රමාණ බැති සිතින් සම්භාවනාවට පාත්‍ර කෙරෙන කාව්‍යානුභූතියක් “ලක්මවුනි මගේ” පැදි පෙළෙන් ප්‍රකට වෙයි.

කවියා නිර්මාණය ආරම්භ කරන්නේ ජාත භූමිය වෙත ආශීර්වාද කරමිනි. මල්බර සල් රුකක් වගේ යනු ඒහි ඉතා උචිත කියුමකි.

ආශිර්වාදයෙන් පසු මාතෘභූමිය වන්දනා කරන කවියා සව් සැපත් අබිබවා එහි අගය වැඩිය යුතු අයුරු කුළු ගන්වයි. උපදින හැම භවයකම උපදින්නට ප්‍රාර්ථනා කිරීම ඒහි අර්ථය වඩාත් ඉස්මතු කිරීමකි.

සිව් දෙසින් ගලා හැලෙන ගංගාවන් ලංකා මාතාවගේ “කරුණාව” ලෙස ඇද හැලෙන්නේය යනු අපූරු යෙදුමකි. එහි යෙදෙන මහතයි දිගයි ගම්බීරයි යනු උචිත කියුමක් නොවේ.

බුදු දහමින් හා ඒයින් පෝෂණය වුණු සංස්කෘතිය ඔද වඩන කවියා ඒබැවින් ම ලක් මව හා සෙසු දේශයක් සම කළ නොහැකි යයි කීම අතිශයෝක්ති සහගත සංකල්පයකි.

ජාතික හා ආගමික සංහිඳියාව මතු කරන කවියා කුල නිල ආගම් භේද නපුරු විස ලෙස දක්වයි. “සමගියේ රස කවන සැටි” යන යෙදුම මවක සිය පුතුට ආහාර කවන අයුරු සිහියට නංවන කියුමකි.

බුදුන්වහන්සේගේ ලංකාගමනය සිහිපත් කරන කවියා ඒයින් ඓතිහාසික පූජනීයත්වය රසික මනස වෙත අදී. එය තව දුරටත් කුළු ගැන්වෙන්නේ මහින්දාගමනය පිළිබඳ යෙදුමෙනි. “ඔබේ මුවට මුව තබමින් උරමි එමී” යන යෙදුම කාව්‍යෝක්තියේ ගැඹුර නැසෙන අනුචිත කියුමක් වේ.

දහඅටමත් විරිත (සමුද්‍රඝෝෂ වරිත) භාවිත කරන කවියා යුගයට ආවේණික කවි බස මෙහිදී උපයුක්ත කොට ගත් බව පෙනී යයි. “මල් බර සල් රුකක්” වගේ යනු ඉතා උචිත උපමාවකි . ඒයින් සෞභාග්‍යය මෙන්ම සශ්‍රීකත්වය ද ධ්වනිත වෙයි. ලක් මවුනි, සෙනේදම, බුදු දම් අමා කිරි, කඳු වන රස, සමය කුල නිල බේ නපුරු විස, සමගියේ රස, සමනොල මල් යහන්කුස, දම් මී, ආදි රූපකාලංකාරවත් යෙදුම් කවියාගේ කවීත්වය ප්‍රකට කරයි. හැම තැනේදිම, දහ අත ගලන, පුදුමයි කවන හැටි, ආදි යෙදුම් කටවහර ආශ්‍රිතයි. “මල් බර සල්” හොඳ නොහොඳ, ගලා ගලා, නළව නළවා ආදි යෙදුම්වලින් හැඟෙන්නේ අනුප්‍රාසවත් බවකි.

(02) ධර්මසේන හිමියන් සද්ධර්මරත්නාවලියේ කතා වස්තු වෙත සානුකම්පික දෘෂ්ටියක් හෙළන අතරම උපහාස රසය ද එක් කිරීමට කටයුතු කර ඇති ආකාරය උදාහරණ සහිත ව සාකච්ඡා කර තිබීම අත්‍යවශ්‍ය වේ.

- **සානුකම්පිත දෘෂ්ටිය**

**මට්ටකුණ්ඩලී වස්තුව**

❖ අදින්න පුබ්බක බමුණාගේ අධික ලෝභී බව ප්‍රකට කරන අවස්ථා කතුවරයා රූපණය කර ඇත්තේ මනුෂ්‍ය චිත්ත සන්තානගත දුර්ගුණ කෙරෙහි සානුකම්පිත දෘෂ්ටියක් හෙළමිනි. එනිසා අදින්න පුබ්බක බමුණාගේ මසුරු බව කෙරෙහි පාඨකයාට ද අහිතක් ඇති නොවේ.

❖ අදින්න පුබ්බක බමුණා සොහොනෙහි හඬමින් සිටින අවස්ථාව ආදිය නිරූපණය කර ඇත්තේ ද සානුකම්පිත දැක්මකිනි.

❖ මසුරු අදින්න පුබ්බක බමුණා ද ආමන්ත්‍රණය කර ඇත්තේ බමුණාණ ආදි වශයෙනි.

❖ අදින්න පුබ්බකගේ මසුරු සිත දුරලා ඔහුට ජීවිතාවබෝධය ලබා දීමට කටයුතු කිරීම ද එම චරිත විෂයෙහි සානුකම්පිත බවක් ප්‍රකට කිරීමෙනි.

**කුණ්ඩලකේසී වස්තුව**

❖ මරන්නට ගෙන යන සොරකු කෙරෙහි ආලයෙන් ඔහු හා සරණ බැඳී ගොස් ගැටලු රැසකට මුහුණපාන කුණ්ඩලකේසියගේ චරිතය ද නිරූපණය කර ඇත්තේ සානුකම්පික දැක්මකිනි.

❖ විරුද්ධ ලිංගිකයන් කෙරෙහි ආකර්ෂණය වීම යොවුන්වියේ ස්වභාවය බැව් උන්වහන්සේ කියනුයේ මෙලෙසිනි.

'ඒ වයස පිරී සිටි ස්ත්‍රීහු යෞවන මදයෙන් මත් හෙයින් පුරුෂයන් කෙරෙහි ලොල්කම ඇත්තෝ ය.'

❖ කුණ්ඩලකේසියගේ ස්වාමිභක්තිය සේම දිවිගලවාගනු පිණිස ඇය අවසානයේ සැමියාව සොරපව්වෙන් හෙළීම ද කතුවරයා විස්තර කරනුයේ උපේක්ෂාවෙනි.

- 'හැමතැනදී ම පිරිමින් උපදෙස් දනිති. නැත. සමහර තැනක ගෑනු ද උපදෙස් දනිති. කිවූ ය.
- 'සිටුදුවණියෝ ද සොරුන්ගේ අකුසල් නැමැති සතුරාත් සහය කොට ගෙන සොරු ගලින් හෙළාලා...'

- උපහාස රසය

**මට්ටකුණ්ඩලී වස්තුව**

❖ අදින්න පුබ්බක බමුණාගේ මසුරු බව ප්‍රකට කරන අවස්ථා ඇතැම්විට කතුවරයා පුන පුනා විස්තර කර දක්වනුයේ මිනිසෙකුට මෙතරම් ලෝභ විය හැකි දැයි යන උපහාසය ද ජනිත කරමිනි.

❖ උපමා යොදා ගනිමින් ද කතුවරයා අදින්න පුබ්බකගේ මසුරු බව කියාපායි.

- 'තණ අග ගලා තෙල් බින්දුවක් විතරක් අනුන්ට නුදුන් විරූය'
- 'ඒ ප්‍රිය පුතණුවන්ට ආභරණයක් කරවන්ට සිතා කෙළගණන් සම්පත් ඇති නැතැත්තෝ නුග ගස මහත් වත් නුග ඵලය කුඩා වන්නා සේ'

❖ අදින්න පුබ්බක බමුණා, තම පුතු දැවූ සොහොනෙහි හඬමින් සිටි අවස්ථාවේ මට්ටකුණ්ඩලී දෙව්පුතු හමුවන අවස්ථාව ද උපහාස රසයක් ද ජනිත වන අයුරින් ඉදිරිපත් කර ඇත.

**කුණ්ඩලකේසී වස්තුව**

❖ සොරපව්වට ගිය අවස්ථාවේ කුණ්ඩලකේසිය කටයුතු කරන ආකාරය නිරූපණය කරනුයේ යටි උපහාස රසයක් උපදවමිනි. එහි දී උපහාසයක් ඇති වනුයේ සොරු කෙරෙහි ය.

- බල එකෙක් නම් මිය යන ගමනේ මා සිතක් මතක් සේ වැලඳගත දූන මැනවැයි කිවූය.....යහපත සොඳුර වඳුව...
- ' ස්වාමිනි මේ කෙළවර දැක්මය මෙවක් පටන් මුබවහන්සේ දැක්මකුත් නැතැ කියාලා..

'මෙයට අමතරව වෙනත් සුදුසු උදාහරණ දක්වමින් පිළිතුරු සැපයිය යුතුය.

**නැතහොත්**

මිනිස් සිතෙහි සංකීර්ණ ස්වභාවය ජාතක කතාකරුවා නිරූපණය කර ඇති ආකාරය නියමිත ජාතක කතා ඇසුරෙන් උදාහරණ සහිත දක්වා තිබිය යුතු ය.

- **චුල්ලධනුද්ධර ජාතකය**

❖ චුල්ලධනුද්ධර තම බිරිඳ සමග වනාන්තරයේ ඇවිද යන විට, දඩමස් ගෙනෙන්නට සොරුන් හමුවට, තම බිරිඳ තනිවම පිටත් කර හැරීම.

❖ සොර නායකයා මරා දමන්නට බිරිඳගෙන් කඩුව ඉල්ලූ විට චුල්ලධනුද්ධරට කඩුවෙහි කොපුව දී සොරාට කඩුමිට ලබා දීම.

❖ සොර නායකයා චුල්ලධනුද්ධරගේ බිරිඳ විෂයෙහි කටයුතු කළ ආකාරය.

❖ චුල්ලධනුද්ධරගේ බිරිඳ අවසානයේ වරද පිළිගෙන ඉදිරියේ දී තමන් එවන් වැරදි සිදුනොකරන බව ප්‍රකාශ කිරීම

- **චන්දකින්නර ජාතකය**

❖ බරණැස් රජතුමා කිඳුරාගේ දිවි තොර කර කිඳුරිය සරණ පාවා ගන්නට සිතීම හා ඒ සම්බන්ධව ක්‍රියා කරන ආකාරය.

❖ අතිශය සුකොමළ තැනැත්තියක වුව ද කිඳුරිය ඇවැසි අවස්ථාවේ බලවතුන්ට ද බියනොවී අභියෝග කිරීම.

ආදි සිද්ධි හා අවස්ථා ඇසුරෙන් උදාහරණ දක්වා තිබිය යුතු ය.

(03) මනුෂ්‍ය චර්යාවන්හි පවත්නා කාමශක්ත ස්වභාවය නිරූපණය කොට එහි ප්‍රතිවිපාක පෙන්වා දීම.

**ස්වර්ණතිලකා කතාවස්තුව.**

කාමශක්ත මනුෂ්‍ය චර්යා

"මා දුටුවා වූ යම් ම පුරුෂයෙක් කාමයෙන් මූර්ඡාව හෙවයි"

"මම ඉදින් සැබැවින්ම ගැහැනියක් වීම් නම් ඒ උද්දාල බ්‍රාහ්මණයා හා වාසය කෙරෙම්මය"

"මෙබඳු වූ වර්ණ සෞන්දර්යක් හා රූප සම්පත්තියකින් යුක්ත වූ ස්ත්‍රී රත්නයක් නොලබන්නා වූ මට ජීවිතයෙන් ඇති ප්‍රයෝජන කිම් දැයි ශෝකාකූලව........."

"උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරවාගෙන හුන් පලස මඳක් පහ කොට ශරීර ප්‍රභා විහිදුවාලූහ"

"ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතුව මහත් වූ ශෝකයෙන් දාහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුව නාසිකා හා කඳුළු ධාරාවෙන් තෙත් වූ නෙත් ඇති ව විසංඥ විය"

ආදි සිද්ධි හා අවස්ථාව ඇසුරින් පැවසිය යුතුය

**එහි ප්‍රතිවිපාක**

"අතරමඟ රාජධානි පසෙක රජදරුවෝ පස්දෙනෙක් ඇගේ රූප සම්පත්තිය දැක කාමයෙන් මත් ව කඩු ගෙන තමන් හිස් තුමූ ම කපාගෙන මළහ"

"ප්‍රිය වස්තූන් නිසා වස්තුකාම ක්ලේශකාමයෙන් මූර්ඡාව නොයෙක් ව්‍යසනයට පැමිණෙන්නාහුමය"

"මෙබඳු ස්ත්‍රීරත්නයකින් වියෝව ජීවත්වීමට වඩා මිය යාම යහපතැයි මහත් වූ ශොකයෙන් නොයෙක් ප්‍රලාප කියා හඬමින් රාජාංගණයෙහි දර සෑයක් බඳවා ගිනි වැද මළේය"

"කාමී පුරුෂයෝ පරලොව විඳිනා අපාය දුක් තබා මෙම ජාතියෙහි මෙසේ නොයෙක් වැසන විඳ මරණයටත් පැමිණෙන්නාහුමය"

<u>**නන්දි වාණිජ වස්තුව**</u>

කාමලෝලී මනුෂ්‍ය චර්යාවන්

"විරීය දසාව බැලූ වෙළෙඳ භාර්යාව දැක උන්ගේ රූප නැමැති සුරා පානයෙන් එම විට උමතුව ගියා සේ මූර්ඡාව භ්‍රාන්තව ගිය සිත් ඇතිව"

“එක් කෙල්ලක කැඳවා කිසි කෙනෙකුන් නොදන්නා ලෙස රහසින් රන් දහසක් දී ඒ දාසිය වෙළෙඳාණන්ගේ භාර්යාවන් සමීපයට යැවීය ”

“ඒකාන්තයෙන් මූ තමන්ගේ ගෙහිමියාණන් මළහොත් මා හා සමඟ වාසයට ලැබෙන්නීමය”

**එහි ප්‍රතිවිපාක**

“පුරුෂයෝ පරස්ත්‍රීන් සේවනය කෙරෙද්ද ස්ත්‍රීජාතිහු පරපුරුෂයන් සේවනය කෙරෙද්ද එසේ අපරාධ කළ දෙපක්ෂයටම දෝෂ පැමිණෙයි. දඬදීම් ආදියත් වන්නේය. මෙසේ මෙලොව නොයෙක් බැසනත් විඳ පරලොව නරකයෙහි ඉපද ඉවසිය නොහැකි දුක් විඳිති.”

“ආපස්සේ ඇවිත් අමාත්‍යයා හා යකැදුරා දෙපලු කොට පොලු ගසා ආවේශ ව ගිය මිනියත් එතනම එලා ගිය”

“සියලු විපත්තියට ඒකාන්ත කාරණය ව සිටි කාමරාගය දුරුකොට හැර.......”

මේ ආදි සිද්ධි හා අවස්ථා ඇසුරෙන් පිළිතුරු සපයා තිබිය යුතුයි.

**(03) නැතහොත්**

ජීවන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැප වන චරිත.පූජාවලියෙහි නිරූපණය කර ඇති ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර තිබිය යුතුයි.

**ජීවක කතා වස්තුව**

“මගේ කිසි නැසිය යුතු කෙනෙකුන් නැත. මතු මට හිමි වන කුල සැපතකදු නැත. එසේ හෙයින් මා විසින් ශිල්පයක් හදාරාගත මැනව. ශිල්ප බලයෙන් බොහෝ දෙනා නෑ කොට ගෙන ධන උපදවාගත මැනව”

“වෛද්‍ය ශාස්ත්‍රය නම් දතුවාහට මෙලොවත් වැඩවෙයි. පරලොවත් වැඩවෙයි. පින් වෙයි. එසේ හෙයින් වෛද්‍ය ශාස්ත්‍රයම උගනිමි. ”

“තෙල රුජාව සන්හිඳුවාලා මුත් නොයෙමි.වැළිදු ධන හානියකුත් නො කෙරෙමි. මාගේ ශාස්ත්‍ර බල දක්වා මුත් කිසිවක් නො ගන්මි.”

“අද ම සංහිඳුවාලමි. දිවි පමණින් මතු ඇති වියත් නොදෙමි. මගේ සුරුකම් බලා වදාළ මැනවි.”

**අනුරුද්ධ කුමාර කතාව**

“ මට සනා ඇතියේ නම් නුඹ මහණ වන්ට නොගොස් මා ම පළමු කොට මහණ වන ලෙස බුදුන් කරා යවාපුව මැනව.”

“මැණියන් වහන්ස, බුදුන් කරා ගොස් මහණ වනු කැමැත්තෙමි මට අවසර දුන මැනව”

“මම උපදෙසකින් උනුත් එක් කොට ගෙන මහණ වෙම් ම ය සිතා මහණ වන සේ ගිවිස්වා ගනිමි.”

“එකලාව වලට ගොස් තපස් කිරීම නම් විශේෂයෙන් බැලූ කල දුක් විඳීමෙක් නොවෙයි. ඒකාන්ත සුව විඳිමෙක. යහළු දෙබසක් නොකියව. මහණ වන්ට යමහ”

ආදී යෝග්‍ය සිද්ධි හා අවස්ථා ඇසුරෙන් පිළිතුරු සපයා තිබිය යුතුයි.

(4)

(අ) කෝට්ටේ අවධිය සිංහල සාහිත්‍යයේ සුවිශේෂී අවධියක් ලෙස සැලකෙන්නේ එකල පැවැති දියුණු සාහිත්‍ය පුනරුදය නිසා ය. ගද්‍යය අභිබවා පද්‍යයේ විශාල දියුණුවක් දැකගත හැකි වීම මේ අවධියේ සාහිත්‍යයේ කැපී පෙනෙන ලක්ෂණයකි. මේ සාහිත්‍ය දියුණුව කෙරෙහි බල පෑ කරුණු රැසකි.

- ❖ පිරිවෙන් අධ්‍යාපනයේ ඇතිව තිබූ දියුණුව
  තොටගමුවේ විජයබා පිරුවන, පැපිලියානේ සුනේත්‍රාදේවි පිරුවන, කැරගල වනරතන පිරුවන, වීදාගම සනානන්ද පිරිවෙන් වැනි පිරිවෙන්

- ❖ ගිහි පැවිදි පඬිවරුන් රැසක් සාහිත්‍යකරණයේ නියැලී සිටීම
  උදා:- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි, වැත්තෑවේ හිමි. වීදාගම මහා මෛත්‍රේය හිමි, සවෙනි සිරි පැරකුම් නිරිඳු, නන්නූරුතුනයියාර්, ශ්‍රී රාම චන්ද්‍ර කවි භාරතී වැනි පඬිවරුන්
- ❖ රජතුමාත් අමාත්‍ය ගණයාත් සාහිත්‍ය කටයුතුවල නියැලීම හා ග්‍රන්ථකරණයට අනුග්‍රහය දැක්වීම.
- ❖ සන්දේශ කාව්‍යයෙහි වර්ධනය හා සිවුපද කාව්‍ය ජනප්‍රිය වීම
- ❖ ග්‍රාමවාසී හා ආරණ්‍යවාසී භික්ෂු සම්ප්‍රදාය දෙක අතර පැවැති සාහිත්‍ය තරගය
  උදා:- ගිරා සන්දේශය හා හංස සන්දේශය මේ තරගය පිළිබිඹු කරන්නා වූ නිර්මාණ දෙකක් ලෙස සැලකෙයි.
- ❖ පද්‍ය සාහිත්‍යයේ නවාංග රැසක් සමග විවිධාංගීකරණයක් දක්නට ලැබීම
  මහාකාව්‍ය - කාව්‍යශේඛරය
  ජාතක කාව්‍ය - ගුත්තිල කාව්‍ය
  සන්දේශ කාව්‍ය - සැළලිහිණිය ඇතුළු පඤ්ච මහා සන්දේශ කාව්‍ය
  ප්‍රශස්ති කාව්‍ය - පැරකුම්බා සිරිත
  භක්ති කාව්‍ය - බුදුගුණාලංකාරය
  උපදේශ කාව්‍ය - ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය
  ප්‍රහේලිකා කාව්‍ය - දහම්ගැට මාලය
  ශතක කාව්‍ය - එළුසිලෝ ශතකය
- ❖ පද්‍ය සාහිත්‍යයේ ආකෘතිය, අන්තර්ගතය හා භාෂාව අතින් උසස් තත්ත්වයක් දක්නට ලැබීම
  ආදි කරුණු මෙම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

(ආ) විවිධ විරිත් භාවිත කළ අන්දම හා ඒවා කාව්‍ය අර්ථය සමග බැඳී පවත්නා අවස්ථෝචිතභාවය විවරණය කිරීම.

1. මහ පියුම් ගී විරිත - සිද්ධි හා අවස්ථා අඛණ්ඩ කථනයෙන් ඉදිරිපත් කිරීමේ දී
   උදා කැර මිණි බරණ රැස් .... ආදි කවි
2. වසන්ත විරිත - ප්‍රීතිමත් අවස්ථා වර්ණනා කිරීමේදී
   උදා - සඳවා සුදු වැලි පිවිතුරු.... ආදි කවි
3. පෙද විරිත - මිහිරි අවස්ථා වර්ණනා කිරීමේදී -
   උදා - කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ.... ආදි කවි
4. සව්සිමත් විරිත - සුරඟන රැඟුමෙහි සොඳුරුතාව වර්ණනා කිරීමේදී.-
   උදා - රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී.... ආදි කවි

(ලකුණු15)

5. බැද්දේගම නවකතාවේ සාර්ථකත්වය උදෙසා නවකතා භාෂාව උපයෝගී වී ඇති ආකාරය උදාහරණ සහිත ව පෙන්වා දිය යුතු ය.

❖ බැද්දේගම නවකතාව ඉංග්‍රීසි භාෂාවෙන් සිංහල භාෂාවට පරිවර්තනය කළ නවකතාවක් වුව ද එහි උපයුක්ත භාෂාව ජීවගුණයෙන් යුක්ත ය.

❖ පාඨකයා ආකර්ෂණයට පත් කරමින් හා නවකතාවට පසුබිම් වූ පරිසරය පිළිබඳ පෘථුල අවබෝධයක් ලබා දෙමින් නවකතාවේ ආරම්භක ඡේදය පවා කාව්‍යාත්මක ව ඉදිරිපත් කර ඇත.

❖ ලිඛිත වහරේ ප්‍රකට වදන් සේම කටවහරේ යෙදෙන වදන් ද යෝග්‍ය පරිදි සංයෝග කර ඇත.

'' මහ මුහුදටත් කඳුවැටිවලටත් අතර පහත රට තැනිතලා ප්‍රදේශයක පිහිටි ගමකි බැද්දේගම. ඒ අවටින් වූයේ ඝන කැලෑවකි.....,''

'' ..... ගෙම්දුල් හා එළිමහන් තැන් අකුල් කරගෙන මැටි ගෙවල් මිරිකා ගෙන මං පෙත් අවුරාගෙන වනය හාත්පසින් ම වැඩුණේ ය.

❖ චරිත නිරූපණයේ දී එදිනෙදා කටවර සජීවීව ලෙස උපයුක්ත කොට ගෙන ඇත.

'' මං උඹලාට කොච්චර කීවා ද? ගස්වල යක්කු උඹලා යන පාරවල් අයිනේ හැංගිලා බලා ඉන්නවායි කියල. දවල් තිස්සේ මං උඹලා රැක්කා. රෑ තිස්සේ තුරුලු කරගන උන්නා ....''

❖ ධ්වනිතාර්ථවත් භාෂාවක් යොදාගෙන ඇත.

''නිතර හමන දූවිලි පටලයෙන් සුදුව ගිය දුඹුරු පැහැති කොළ කැදැල්ලෙන් ගහණ වූ කොරසැඩි පොතු ඇති මහ ගස්වල කඳන් ....''

❖ අදාළ පුද්ගල චරිතවලට යෝග්‍ය පරිදි දෙබස් හා සංවාද යොදා ගෙන ඇත.

❖ නවකතාවේ චරිතවල මනෝභාව නිරූපණයට අදාළ වන සේ පරිසර වර්ණනා ඉදිරිපත් කර තිබීම

''ඇසළ මල් රැනින් මුළු වනය රන්වන් වුණේ ය. සුදු කරඹ මලින් ද සුදු හා දම් පාට කෙතන් මලින් ද පඬුරු වැසී ගියේ ය. .....''

'' .... අවට සෞන්දර්යයෙන් උද්දීප්තිමත් වූ ඇගේ ශරීරයේ ලේ අමුතු උද්‍යෝගයකින් නහර දිගේ දීවේ ය. තරුණ ගෝනකුගේ රාග නිශ්‍රිත කෑ ගැම වනයේ රැව් දීගෙන ගියේ ය. ....''

❖ ප්‍රාදේශීය ව්‍යවහාර භාවිතය මෙන් ම උපමා රූපකවලින් යුතු කාව්‍යාත්මක භාෂා ව්‍යවහාරයක් උපයුක්ත කර ගැනීම ද මෙම නවකතාවේ භාෂාවෙහි සාර්ථකත්වයට බල පා ඇත.

සුදුසු උදාහරණ දක්වමින් පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ය.

(6) ළමා ලෝකයේ නිර්ව්‍යාජ සිතුවිලිනූතන කෙටිකතාකරුවන් වස්තු විෂය කොට ගෙන ඇති , ,මේ සඳහා වෙසක් පහන .ආකාරය නියමිත කෙටිකතා ඇසුරෙන් විමසීම මෙහි දී අපේක්ෂිත ය හැත්තෑ ලක්ෂයෙන් එකෙක් ආදි කෙටිකතා ඇසුරෙන් උදාහරණ දක්වා ,අකුරට යන වෙලාවේ එහි දී ප .තිබිය යුතු යහත දක්වා ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කර තිබීම සුදුසු ය .

❖ ළමා ලෝකයට සමීප වූ අද්දැකීම් තෝරා ගැනීම
❖ ළමයින්ගේ විවිධ වූ ක්‍රියාකාරකම් උපයෝගී කර ගැනීම
❖ විවිධ සමාජ පන්ති නියෝජනය කරන්නා වූ ළමුන්ගේ චරිත නිරූපණය
❖ ළමුන්ගේ එදිනෙදා කථා බහ හා සංවාද ආදිය සජීව ලෙස ඉදිරිපත් කිරීම

ළමා ලෝකයේ නිර්ව්‍යාජ සිතුවිලි නූතන කෙටිකතාකරුවන් වඩාත් හොඳින් කෙටිකතා සඳහා සමීප කර ගෙන ඇති ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කොට තිබිය යුතු ය .

.07 මා පිය දූ දරු සබඳතාවෙහි විවිධ පැතිකඩ කාව්‍යාත්මක ව විවරණය කිරීමට කවීන් ප්‍රයත්න දරා ඇති ආකාරය සාකච්ඡා කිරීම මෙහි දී අපේක්ෂිත යදරු රට ,පොඩි දූව , රන්තැටියක කඳුළු . පන්ති ඇසුරෙන් උදාහරණ දක්වමින් මෙම පිළිතුර ඉදිරිපත් කර තිබිය යුතු ගිය පුතු ආදි පද්‍ය .එහි දී පහත දක්වා ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කර තිබීම සුදුසු ය .ය

❖ දෙමාපියන් හා දූ දරුවන් අතර පවතින ස්නේහයෙහි දෘඪතරබව
❖ විවිධ වූ හේතු කරණ කොට ගෙන දරුවන් දෙමාපියන්ගෙන් දුරස් වීම නිසා ඇතිවන වේදනාව
❖ විවිධ සමාජ ස්තරවල වෙසෙන දරුවන් හා ඔවුන්ගේ දෙමාපියන් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවල වෙනස්කම්
❖ මා පිය දූදරු සබඳතාවේ පවතින විශ්වීය බව

මා පිය දූ දරු සබඳතාවෙහි විවිධ පැතිකඩ කාව්‍යාත්මක ව විවරණය කර ඇති ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කොට තිබිය යුතු ය .

(8) ස්ත්‍රී පුරුෂ ප්‍රේමය ගැඹුරු හා සියුම් මානව ධර්මතාවක් බව නාට්‍යයේ විවිධ සිද්ධි හා හැසිරීම් ඇසුරෙන් තහවුරු කර තිබිම මෙම පිළිතුරේ දි අපේක්ෂා කෙරේ.

* උද්දාල බමුණා ප්‍රේමය ගැන කරන ප්‍රකාශය

  ඈත සිට පිරිනමන භක්තිය
  ගෙනත් පාමුල තබන බුහුමන
  ඒ එකක් වත් නොවේ සෙනෙහස,
  දිවා රෑ දෙක හද සමීපේ
  දෑස නොපියා බලා ඉන්නා
  දෙයකි සෙනෙහස

* ශිෂ්‍යයන් දක්වන භක්ති ප්‍රේමයට වඩා ස්ත්‍රී පුරුෂ ප්‍රේමය හදවතට සමීප සියුම් දෙයක් බව දැක්වීම

  හදවත් කතරේ මලක් පිපෙන්නට
  වියළුණු පොළොවෙන්
  මතු වී එන්නට
  සදා නොමැලවී පිපී තිබෙන්නට
  මා නිසා නෙත් මිණි පහන් තුළ
  දල්වනුය පෙම් දැල්ල නොනිවා
  ඒකලු කරනුය ම හද මැඳුරත
  අරක් ගෙන ඇති අඳුර දුරලා

* උද්දාල බමුණා සිසුන්ට ඉගැන්වීමට නොයා ස්වර්ණතිලකා වෙත රැඳී සිටින විට ඇය ඔහුට සේවයට යන ලෙස ඉල්ලීම් කරන අවස්ථාවේ දී මාස හතරක් යන්නටත් පෙර තමා ඇයට එපා වී ද යනුවෙන් උද්දාල බමුණා විමසීම.

  මා යවන්ට කැමති ද ඔබ
  නිරතුරු ඇවිටිලි කරන්නේ
  අරුචි වී ද මා ඔබ හට
  සාර මසක් නොයන තුරුම?

* රාජ සේවයට නැවත යන්නට සිදු වීම වියෝවීමක් ලෙස සැලකීම

  ගොස් සමා යැද රජිඳු
  යම් විගස සිප් සැලට
  යළිත් මා සිසුන් වෙත
  ඒවිට අප දෙදෙන හට
  නොවන්නේ ද වියෝ දුක?

මදක්වත් වෙන් වී සිටීම නොරිසි වීම මෙහි දී හඳුනා ගත හැකිය.

* ස්වර්ණතිලකාට සිදුවූ කුරිරු ඉරණම නිසා උද්දාල බමුණා අතිශය කම්පනයට පත් වීම

සදා කලට පහන නිවී

අඳුර අරක් ගත් මේ ගේ තුළ

කෙලෙස ද මා පසු වන්නේ?

ස්ත්‍රී පුරුෂ ප්‍රේමය ගැඹුරු හා සියුම් මානව ධර්මතාවක් බව නාට්‍යය ඇසුරෙන් සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2023(2024)

# 71 සිංහල - II

# ලකුණු බෙදී යාම -II පත්‍රය

1 කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 01 | 3 | 11 | 3 |
| 02 | 4 | 12 | 4 |
| 03 | 1 | 13 | 5 |
| 04 | 2 | 14 | 5 |
| 05 | 3 | 15 | 1 |
| 06 | 1 | 16 | 5 |
| 07 | 5 | 17 | 2 |
| 08 | 4 | 18 | 4 |
| 09 | 5 | 19 | 1 |
| 10 | 2 | 20 | 3 |

02.

(අ)

(i). පෞද්ගලික ව්‍යවසායකයන් පැවැති අවස්ථාවලින් ප්‍රයෝජන ගැනීම මන්දගාමී නිසා

(ii). ලාභ ආයාත භාණ්ඩ දිවයින තුළට ගලා ඒම/පැමිණීම

(iii). යුනයිටඩ් මෝටර්ස් ආයතනය

(iv). පොහොර, ආකර සහ ඛණිජ ඇඹුරුම් ද්‍රව්‍ය, ඉස්කාගාර, සීනි, ධීවර සහ දැව යන සංස්ථා

(v). වතු වැවිලි රජයට පවරා ඒවායේ පාලනය සඳහා

(vi). මූලික කර්මාන්ත රජයේ අයිතිය යටතේ තබා ගැනීම

මූලික නොවන කර්මාන්ත පෞද්ගලික අංශය සඳහා වෙන් කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී රජය ආධාර සැපයීම

(ආ) සාරාංශය

පොත් කවර කලාව මුද්‍රණ ශිල්පය සමග වර්ධනය විය. චීනයේ සිට මුද්‍රණ ශිල්පය අපරදිගට සංක්‍රමණය විය. අපරදිග මුද්‍රණ ශිල්පයේ පියා ලෙස සැලකෙන ගැටෙන්බර්ග් 1400 දී මයිනස් බයිබලය නම් ග්‍රන්ථය මුද්‍රණය කළේය .ක්‍රි.ව. 1505ට පෙර යුරෝපයේ මුද්‍රිත, බටහිර මුද්‍රණ ඉතිහාසයේ තොටිල්ලේ යුගයට අයත් පොත්වල කවර නම, ප්‍රකාශන තොරතුරු සහිත සරල ඒවා වුව

ද ඇතැම් විට පූජකයන් ප්‍රවීණත්වය දැරූ රූබ්‍රික් නම් අලංකෘත අකුරු සහිත කවර ද මුද්‍රණය කෙරුණි. පොත් මුද්‍රණය බහුල වත් ම කවර ද නවීකරණය විය.

**03.** රචනාව

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය

ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම

iii. කරුණුවල පැහැදිලිබව

iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම

v. ව්‍යාකරණ දෝෂ රහිත වීම

vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම

vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම

viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

4.

අ.

i. එදිරිවීර සරච්චන්ද්‍ර නවකතා රචකයකු මෙන් ම නාට්‍ය නිෂ්පාදකවරයෙක් ද විය.
ii. වැද්දන් විසින් සතුන් දඩයම් කෙරෙති / කරනු ලබති.
iii. නිවැරදි වාක්‍යයකි.
iv. ඇතැමකු ගී ගයද්දී පිරිස රංගනයෙහි නිරත වූහ.
v. බොහෝ මිනිසුන් ආත්මාර්ථකාමී වන්නේ ඇයි?

(ලකුණු 01 x 5 = 05යි)

ආ.

i. මැණියන් විසින් තම දරුවෝ නොමඟට යා නොදී රැකෙති/රකිනු ලබති/රකිනු ලබත්/රකිනු ලැබෙති/රකිනු ලැබෙත්
ii. කර්මාන්තශාලා හිමියන් විසින් සේවකයන්ට දිරි දීමනා දෙන ලදි /ලද්දේ ය /දෙනු ලැබී ය / දෙනු ලැබිණි/දෙනු ලැබිණ/දෙනු ලැබුවේ ය.
iii. අමාත්‍යාංශ ප්‍රධානීන් විසින් ස්වකීය ආයතනයේ කටයුතු අධීක්ෂණය කරන ලදී/ලද්දේ ය / කෙරිණ/කැරිණ/කරනු ලැබී ය/ලැබුවේ ය.
iv. ඇමතිතුමා විසින් මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවාව විධිමත් කිරීමට කටයුතු යෙදිණ/යෙදිණි/කරන ලදී/ලද්දේ ය /කරනු ලැබී ය/ලැබුවේ ය/කරන ලද්දේ ය.
v. සොබාදහම ප්‍රිය කරන්නන් විසින් වෘක්ෂලතාවෝ සුරක්ෂිත කෙරෙති/කැරෙති/කරනු ලබති/ලබත්/ලැබෙති/ලැබෙත්.

(ලකුණු 01 x 5 =05යි)

ඉ.

i. විද්වතුන් - මාධ්‍යවේදීන්
ii. පාලකයන් - පාරිභෝගිකයෝ
iii. නර්තන ශිල්පීන් - ආරාධිතයෝ
iv. මිනිසුන් - බලධාරීන්
v. අයකු - ව්‍යාපාරිකයකු

(ලකුණු 01 x 5 =5යි)

5.

| | වචන | ව්‍යාකරන අංගය | අනු අංගය |
|---|---|---|---|
| 1 | වචන වලින් | විභක්ති | අවධි විභක්ති |
| | විවිධාර්ථ | සන්ධි | ස්වර්ණ /දීර්ස/සමානස්වර<br>දීර්ස සන්ධි |
| | සඳහා | නිපාත | පිණිසාර්ථයේ නිපාත |
| 2 | දර්ශනීය | කෘදන්ත | යුතු(දැකිය යුතු) යන<br>අර්ථයේ කෘදන්ත |
| | සැදැහැති | සන්ධි | පරස්වර ලෝප සන්ධිය |
| | වඩවයි | ක්‍රියා | ප්‍රයෝජ්‍ය ක්‍රියා |
| 3 | කම්කරුවෝ | සමාස | විභක්ති/කර්ම විභක්ති<br>සමාස |
| | වැටුණු | කෘදන්ත | අතීත කෘදන්ත |
| | ඉක්මනින් | විශේෂණ | ක්‍රියා විශේෂණ |
| 4 | දරුදැරියන් | සමාස | දකාර්ථ සමාස |
| | පෞරුෂය | තද්ධිත | භාවාර්ථයේ තද්ධිත |
| | සැකසීම | කෘදන්ත | භාවාර්ථ/භාවකාරක<br>කෘදන්ත |
| 5 | ගොවීහු | විභක්ති | ප්‍රථමා විභක්ති |
| | ඉමහත් | උපසර්ග | අධිකාර්ථයෙහි/අර්ථය<br>වැඩි/තීව්‍ර කිරීමේ උපසර්ග |
| | දරා | ක්‍රියා | පූර්ව ක්‍රියා |

(ලකුණු 01 x 3x 5 = 15යි)

6. (අ)

i. මහා
ii. විචිත්‍ර
iii. ඝන
iv. විසිතුරු
v. මහ
vi. ගන

(ලකුණු 01/2x 6 =03යි)

(ආ) කාශ්‍යප රජතුමා රජ වීමටත් පෙර සීගිරිය ජනාවාසයක් වී/ව පැවති බව පුරාවිද්‍යාඥයෝ කියති.

(ලකුණු 01/2x 6 =03යි)

(ඉ)

| | | |
|---|---|---|
| i. | මිතුරකු | -කර්ම විභක්තිය /කම් විබත |
| | අපට | -සම්ප්‍රදාන විභක්තිය /සපදන් විබත |
| ii. | ගසේ | -සම්බන්ධ විභක්තිය /සබඳ විබත |
| | මලේ | -අධාර විභක්තිය /අදර විබත |
| iii. | අම්මා | -කර්තෘ විභක්තිය /කතු විබත |
| | දුව | -ප්‍රථමා විභක්තිය /පෙර විබත |

(ලකුණු 01/2x 6 = 03යි)

(ඊ) "දරුව, ඔබට ගීතයක් ගායනා කළ හැකි ද?" යන ප්‍රශ්නය අසත් ම, වේදිකාව වෙත පැමිණි සිහිත්තා මිහිරි හඬින් ගීතයක් ගයද්දී ප්‍රේක්ෂකයෝ නැඟී සිටියහ; අත්පොළසන් දුන්හ; ස්තුති කළහ

(ලකුණු 01/2x 6 = 03යි)

(උ)

i. තමා ඔවුන් ඉතා හොඳින් හඳුනන බව මිතුරා පැවසී ය
ii. මාර්ගයෙන් ඉවත් වී තරගකරුවන්ට ඉඩ දෙන ලෙස සංවිධායකයා නරඹන්නන්ගෙන් ඉල්ලා සිටියේ ය.
iii. යල කන්නයට පෙර වැව ප්‍රතිසංස්කරණය කර දෙන බවට නිලධාරිහු පොරොන්දු වූහ.

(ලකුණු 01/2x 6 = 03යි)

7.

i. දිවි, පරෙවි, පොළොං, මුව, මොනර, වලස්, සැවුල්,

| | | |
|---|---|---|
| ii. | යසුණු රුසක් | -කෙටිපාපිල්ල,කෙටිපාපිල්ල, කෙටි ඇදය,/ඇක්ම |
| | සිවුපා | -කෙටි ඉස්පිල්ල, කෙටිපාපිල්ල, ඇලපිල්ල |
| | පුරුෂයාට | -කෙටි පාපිල්ල, කෙටිපාපිල්ල, ඇලපිල්ල |

iii. තැවි තැවී, සල සලා, බල බලා

| | | | |
|---|---|---|---|
| iv. | නොයෙක් | -නො+එක් | -ආගම සන්ධිය/ආගම් සඳ |
| | සර්වාංගික | -සර්ව+ආංගික | -ස්වර්ණ දීර්ඝ/සමානස්වර දීර්ඝ |
| | වනැතුනට | -වන+ඇතුනට | -පූර්ව ස්වර ලෝප සන්ධිය/පෙර සර ලොප් සඳ |

(විසන්ධි කිරීමට ලකුණු ½ යි. සන්ධි විධිය දැක්වීමට ලකුණු ½ යි)

v. සුලභ

(ලකුණු 05 x 03=15යි)

8.

i. සර්වනාම පද

නාම පද වෙනුවට යෙදෙන නාම සර්ව නාම ලෙස හැදින්වේ. මේවා පුරුෂ, ලිංග වචන භේදය අනුව වෙනස් වේ.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| උත්තම පුරුෂ | මම | අපි |
| මධ්‍යම පුරුෂ | තෝ, නුඹ, ඔබ | තොපි, තෙපි, නුඹලා, ඔබ |
| ප්‍රථම පුරුෂ | හේ, හෙතෙම, ඔහු, මොහු | ඔවුහු, ඒවා, මේවා |
| | ඕ,ඕතොමෝ, ඈ, මෑ, ඒ, එය, මෙය | |

මේ හැර සමහර ඇතැම්, කිසි, ආදී,සර්ව නාම අනියමාර්ථයෙහි ද සියලු, අය, සෑම, ආදි සර්ව නාම සමූහය හැඟවීමෙහි ද යෙදේ.

ii. ඕෂ්ඨජාක්ෂර

යටි තොල හා උඩු තොල සම්බන්ධ වීමෙන් හෙවත් ස්පර්ශයෙන් උපදින ශබ්ද ඕෂ්ඨජාක්ෂර නම් වේ. ඕෂ්ඨජ යන්නෙහි අර්ථය ද තොල්වලින් උපදින යනුයි.

අක්ෂර මාලාවේ පවර්ගයට අයත් අකුරු වන ප ඵ බ භ ම ඹ යන අක්ෂරත් උ, ඌ යන ස්වරත් ඕෂ්ඨජ ගණයෙහිලා සැලකේ.

iii. පරස්වර ලෝප සන්ධිය

සන්ධි වන පද දෙකෙන් පර පදයේ ඇති මුල් ස්වරය ලොප් කොට පද දෙක එක් කිරීමෙන් ගළපන සන්ධිය පරස්වර ලෝප සන්ධිය යි.

උදා:- අනු+අරුත්
අනු+(අ) +රුත්
අනුරුත්

තවත් උදාහරණ

මුනි+උතුමා -මුනිතුමා
පිළි+තුරු -පිළිතුරු
මුදලි+ඉඳු -මුදලිඳු
ගන+අඳුර -ගනඳුරු
සුර+අඟන -සුරඟන

iv. අසම්භාව්‍ය ක්‍රියා

යම් ක්‍රියාවක් මගින් කාලයක් හෝ අවිනිශ්චිතභාවයක් පළ කෙරේ නම් එබඳු ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා නම් වෙයි. ඒ සඳහා යෙදෙන ප්‍රත්‍යය හා පද කීපයක් පහත දැක් වේ.

කාලාර්ථයේ :ත-කියත -කියත උන් මෙතෙපල ආයේ ය ඇඳුරු ගුත්තිල.
ත්-වත්ම -හිරු උදාවත් ම පියුම් පිපෙයි
දී-එද්දී -මා ගෙදර එද්දී රෑ බෝ විය.
පත -සඳේ මුදුන් පත අස්විද නැකැත සිට
අනියමාර්ථයේ:හොත්-වුවහොත්-එසේ වුවහොත් හිමි ඔහුට මම අතවැසි වෙමි.
ඔත්- ආවොත් -ඔබ ආවොත් මම ද එන්නෙමි.
ත් - වුවත් -එසේ වුවත් මට කම් නැත.

v. අන්‍යාර්ථ සමාස

වෙනස් අර්ථ ඇති පද එක් වී එකී පදවල අර්ථයෙන් බැහැර වූ, අන්‍ය අර්ථයක් පැවසෙන සමාසය අන්‍යාර්ථ සමාසයයි.

බල දසයක් ඇත්තේ-දසබල - එනම් බුදුරජ
සඳ වැනි මුහුණක් ඇත්තී-සඳවත - එනම් ස්ත්‍රිය
නෙත් තුනක් ඇත්තේ-තිනෙත් - එනම් ඊශ්වර
පෙති සියයක් ඇත්තේ-සියපත් - එනම් නෙලුම් මල
මල් හී දරන්නේ-මල්සර - එනම් අනංගයා
අන්‍යාර්ථ සමාස ය ද විභක්ති සමාසය මෙන් විභක්ති ගන්නා බව පෙනේ.

(ලකුණු 05 x 03=15යි)